# B.M.J. TOURS

## VAN RENTALS



Air Port Transfers
Bus & Van Rental
(Up to 24 Seater)
Social Occasions

SannasaAds

CALL COORAY
TEL - 8502 8580
M -0431 396 413
M -0421 741 244
Noble - park

# LA TROBE TAXATION SERVICES

14 day Tax Refund

**INDIVIDUAL RETURNS $70**
(Concession Rates for Students)
**BUSINESS TAX RETURNS**
(BAS / IAS)

La Trobe Taxation Services
BUNDOORA
Registered Tax Agent and Accountant
Contact
Mala : 9470 8241 or 0401 000 421
email : latrobetax@yahoo.com.au



# GATEWAY
LAWYERS

- Advice on Legal Matters
- Business & Commercial Law
- Sale of Business
- Conveyancing
- Powers of Attorney
- Wills & Estate Planning
- Migration Law

**Senanie Kurukularatne** LL.B
**Barrister & Solicitor**
Attorney-at-Law Sri Lanka
Registered Migration Agent
MARN 0854193

T 03 8786 9682
F 03 8786 9681
M 0414 660 513
gateway5@bigpond.net.au
DX 30463 Berwick VIC 3806
PO Box 730 Berwick VIC 3806
17 Glenview Rise Berwick VIC 3806 Australia




# සිනුවර හසුන

### සිඩ්නි සිට ලියමි

සන්නස පාඨකයින් වෙත සිඩ්නි නුවර හෙවත් සිනුවර සාහිත්‍ය, කලා, සමාජමය තොරතුරු ගෙන ඒමේ පරම පවිත්‍ර චේතනාවෙන් ඇරඹුණු සිනුවර හසුන කොලමේ අද දෙලොස් වැනි වාරිකය සඳහා ගොනු කරන්නට ඇති කරුණු බොහෝය.

ගෙවී ගිය ජූලි මාසයේ ශීත සිසිරය මුළු සිනුවරම විටින් විට නිද්‍රාවේ ගිල්වූවද සිංහල කලා රසික ජනතාව ඉන් පසු බට වූ බවක් නම් නොපෙණුනි.

ලංකා සේවා මුක්ත සෙබලියන් ගේ සංවිධානයේ සිඩ්නි නුවර ශාඛාව මගින්, යුධ හමුදාවේ සේවය නිමකළ සෙබලින් ගේ සුභසාධනය සඳහා අරමුදල් රැස් කිරීම පිණිස පසුගිය ද "සෙබලිය" නමින් සංගීත ප්‍රසංගයක් සිනුවර දී සංවිධානය කර තිබුණි. මෙහි ප්‍රධානත්වය ගත්තේ සිනුවර සොඳුරු ගායිකාවක් වන ශ්‍රියානි අබේනායකයි. ඇය 2008 වසරේ "සොඳුරු සිහින" නමින් ගී එකතුවක් එළි දැක්වූ ප්‍රතිභාපූර්ණ ගායිකාවකි. සෙබලිය ප්‍රසංගයේ දී ගී ගැයූ ගායක ගායිකාවන් සංඛ්‍යාව විසිපස් දෙනෙක් පමණ වූහ. මේ සිනුවර වාසය කරන ගායක ගායිකාවන්ගෙන් කොටසක් පමණක් වූ බව කිව යුතුය. ප්‍රසංගයක් ලෙස සංවිධානය කිරීමේ ඇති ප්‍රායෝගික හේතු නොමැති වූයේ නම්, පාන්දර එළි වන තුරු ගී ගයන්නට තරම් කුසලතා පූර්ණ ගායක ගායිකාවන් සංචිතයක් සිනුවර සතුය. ඔවුන් අතර කලක සිට අප දන්නා හඳුනන ප්‍රවීනයෝ ද, එලෙසම ප්‍රතිභා සම්පන්න නවකයෝ ද වෙති.

සිනුවර සිංහල ගී කලා කෙතේ අභිවෘද්ධිය සඳහා ඉවහල් වූ එක් වැදගත් සංසිද්ධියක් වූයේ සිනුවර ස්කැට්ස් සංවිධානයේ අනුග්‍රහයෙන් 2009 වසරේ මුල් කාර්තුවේ පැවති ස්ටාර් ලංකා ආධුනික ගී ප්‍රසංගයයි. ළමා හා වැඩිහිටි කොටස් දෙකකින් යුතුව පැවති මේ ප්‍රසංගික ගායනා තරගයේ දී නිසි කුසලතාවෙන් පිරි නවක ගායක ගායිකාවෝ රැසක් කළඑළි බටහ.

සිනුවර වෙසෙන ප්‍රසිද්ධ ගායකයෙක් වන බොනී ප්‍රනාන්දු ඒ ස්ටාර් ලංකා ප්‍රසංගයේ ප්‍රධාන සංවිධායකයෙකු විය. හැත්තෑවේ දශකයේ පාසැල් වියේ දීම ගායනයට පිවිස ජෙම්ටෝන් ලේබලයෙන් ගී තැටියක් (1976) නිකුත් කළ බොනී, බටහිර ගීතයට ද, සිංහල ගීයට ද එකසේ සමත් කම් දක්වන්නෙක් ලෙස ප්‍රචලිතය. ඔහුගේ නිර්මාණ නාමල් වසන්තේ (1996) සහ රූ රැජිණන් (2006) සංයුක්ත තැටි ලෙස එළි දැක්වී ඇත. බොනී ගයන සිංහල ගී අනිවාර්යෙන් ම එච්. ආර්. ජෝතිපාල විසින් ගයන ලද සුමධුර ගී වේ. ඔහුගේ ගැඹුරු මනෝහර හඬ, ජෝති ගේ ගීතයන් හා මනාව ගැලපේ.

ගෙවුනු ජූලි මාසය ගායක බොනී ප්‍රනාන්දු ගේ ගායන දිවියට ද නොමැකෙන සටහන් එකතු කලේ ය. ඒ එච්.ආර්. ජෝතිපාල විසි දෙවැනි අනුස්මරණ උපහාර "සිරිය මෙ සාරා" ප්‍රසංගයේ ගී ගැයීමට ඔහු ට සුවිශේෂී ආරාධනාවක් ලැබීමයි. පසුගිය වසරේ සිනුවර දී, ජෝතිපාල සමරු ගී ප්‍රසංගයක් "මධුර අතීතේ" නමින් සංවිධානය කල බොනී, පසුගිය හත්වැනි ද එල්පින්ස්ටන් ශාලාවේ දී දහසක් රසිකයින් පිනවූයේ ද ජෝතිපාල ගේ "ආදර මධුර අතීතේ" ගීතය ගයමින් වීම විශේෂයකි. එපමණක් නොව මේ ප්‍රසංගයේ දී සහ ඒ ආශ්‍රිතව පැවති සියළු රූපවාහිනී වැඩ සටහන් වලදී ද බොනී ගී ගැයුයේ සමස්ත ඕස්ට්‍රේලියාව ම නියෝජනය කරමින් වීම අප සැමටම ආඩම්බර විය හැකි කරුණකි.

ජූලි මාසයේ සිනුවර හැඩ කල තවත් කලා උළෙලක් නම් දිනූ දහර නෘත්‍ය ප්‍රසංගයයි. මෙය ඉතා සුවිශේෂී අවස්ථාවක් ලෙස අප සැමගේ අවධානයට සහ ප්‍රසංශාවට ලක් විය යුතුය. එයට හේතුව නම් මේ ප්‍රසංගය මුළුමනින්ම නිර්මාණය කර, සංවිධානය කර තිබුණේ කුඩා දැරියන් ලෙස සිනුවර සිංහල නර්තනය හදරා දැන් වැඩිවියට පැමිණ ඇති අපේම දූවරුන් විසින් වීමයි. ඊටත් වඩා, මේ ප්‍රසංගය ඉදිරිපත් කිරීමේදී ඔවුන් ගේ ප්‍රධාන අරමුණ වී තිබුණේ, තමන් ට සිංහල නැටුම් කලාවේ මුලකුරු කියා දී දැනුවත් කළ, පුහුණු කළ තම ගුරුවරුන් ට ගෞරවය දැක්වීම පිණිස වීමය.

සිනුවර වෙසෙමින් තම ශිල්ප ඥාණය බෙදන ප්‍රධාන නර්තන ආචාර්යවරුන් තිදෙනෙකි. ඔවුන් නම් මාලා අබේවික්‍රම, රාජිනී ෆොන්සේකා සහ දිනේෂ් පෙරේරා යන ත්‍රිත්වයයි.

ඔවුන්ගෙන් ශිල්ප ලද සිසුවියන් ද අද තමන් ගේ ම ඉහල පෙලේ නර්තන නිර්මාණ ඉදිරිපත් කිරීම දක්වා තම කුසලතා වර්ධනය කර තිබීම සිනුවර සිංහල උප සංස්කෘතියේ අනාගතය පිළිබඳව සුභ ලකුණු පෙන්වයි.

මේ සිනුවර හසුන ලියා අවසන් කරමින් සිටින මොහොතේ මට දැනගන්නට ලැබුණේ තවත් එලෙසම සොඳුරු ආරංචියකි. පසුගිය ද "රං කිරිල්ලී" නමින් සිය ප්‍රථම ගී එකතුව ඉදිරිපත් කල සිනුවර ගායිකා ප්‍රසාදිකා වික්‍රමාරච්චි තම ගායන කුසලතා අගෝස්තු මස 15 දින මෙල්බර්න් නුවර දී ද දක්වන්නට සැරසෙන බවකි. එය ද සුභ ලකුණක් සේ මම දකිමි.

ලබන මාසයේ නැවත හමුවෙමු.

*සිනුවර ආරච්චිල*

<sinuwara.arachchila@gmail.com>